**අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය**

Ministry of Education, Higher Education and Vocational Education - Piriven Education Division

கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சகம் - பிரிவேனா கல்விப் பிரிவு

# අන්තර් පාරිවේණික සිසු නිපුණතා ඇගයීම - 2025

## දිස්ත්‍රික් වටය

**සියලු ම හිමිකම් ඇවිරිණි.** **All rights reserved.** **அனைத்து உரிமைகளும் பாதுகாக்கப்பட்டவை.**

**කණිෂ්ඨ අංශය** | **පාලි භාෂා හා සාහිත්‍යඥානය** | **කාලය පැය - 03 යි.**

❖ **පළමු දෙවන** හා **තෙවන** ප්‍රශ්න ඇතුළු ප්‍රශ්න **පහකට පමණක්** පිළිතුරු සපයන්න.

01. කෙටි පිළිතුරු සපයන්න

I. '**වග්ගානං පඨමදුතියාසොචාසොසා**' මෙම සූත්‍රයෙන් කියවෙන අකුරු ලියා දක්වන්න.

II. **සඤ්ඤොගො, ඔනද්ධා** යන පද විසන්ධි කරන්න.

III. **පුල්ලිංග "එත" ශබ්දයෙහි** පඤ්චමී විභක්ති ඒක වචනය හා බහු වචනය ලියන්න.

IV. '**වන්දතං, ජින්දෙරං**' යන ක්‍රියා පදයන්හි ආඛ්‍යාත විභක්ති නම් කරන්න.

V. '**නානා, පුරතො**' යන නිපාත පදයන්හි අර්ථ ලියන්න.

VI. පොල්වත්තේ බුද්ධදත්ත හිමියන් ලියූ ග්‍රන්ථ දෙකක නම් ලියන්න.

VII. පපඤ්චසූදනී අටුවාවෙහි කතුවරයා හා ආරාධකයා නම් කරන්න.

VIII. විනය පිටකයට අයත් ග්‍රන්ථ ලියා දක්වන්න.

IX. චතුභාණවාරපාළියෙහි ඇති බණවර ගණන හා බණවරකට ඇති අකුරු සංඛ්‍යාව ලියන්න.

X. ජාතකට්ඨකථාව රචනා කිරීමට ආරාධනා කළ ආරාධකයන් නම් කරන්න.

***(ලකුණු 2 × 10 = 20යි.)***

02. (I) පහත දැක්වෙන ගද්‍ය පද්‍ය කොටස් සිංහලට පරිවර්තනය කරන්න.

පඤ්චහි ඛො ගහපතිපුත්ත ඨානෙහි අයිරකෙන හෙට්ඨිමාදිසා දාසකම්මකරා පච්චුපට්ඨාතබ්බා, යථාබලං කම්මන්තසංවිධානෙන, භත්තවෙතනානුප්පදානෙන, ගිලානුපට්ඨානෙන, අච්ඡරියානං රසානං සංවිභාගෙන, සමයෙ වොස්සග්ගෙන. ඉමෙහි ඛො ගහපතිපුත්ත, පඤ්චහි ඨානෙහි අයිරකෙන හෙට්ඨිමාදිසා දාසකම්මකරා පච්චුපට්ඨිතා පඤ්චහි ඨානෙහි අයිරකං අනුකම්පන්ති. පුබ්බුට්ඨායිනො ච හොන්ති, පච්ඡානිපාතිනො ච, දින්නාදායිනො ච, සුකතකම්මකරා ච කිත්තිවණ්ණහරා ච. ඉමෙහි ඛො ගහපතිපුත්ත, පඤ්චහි ඨානෙහි අයිරකෙන හෙට්ඨිමා දිසා දාසකම්මකරා පච්චුපට්ඨිතා ඉමෙහි පඤ්චහි ඨානෙහි අයිරකං අනුකම්පන්ති. එවමස්ස එසා හෙට්ඨිමා දිසා පච්ඡන්නා හොති ඛෙමා අප්පටිභයා.

(සිගාලෝවාද සූත්‍රය)

(II) ඔවදෙය්‍යානුසාසෙය්‍ය - අසබ්භා ච නිවාරයෙ
සතං හි සො පියො හොති - අසතං හොති අප්පියො

න භජෙ පාපකෙ මිත්තෙ - න භජෙ පුරිසාධමෙ
භජෙථ මිත්තෙ කල්‍යාණෙ - භජෙථ පුරිසුත්තමෙ

ධම්මපීති සුඛං සෙති - විප්පසන්නෙන චෙතසා
අරියප්පවෙදිතෙ ධම්මෙ - සදා රමති පණ්ඩිතා

උදකන්හි නයන්ති නෙත්තිකා - උසුකාරා නමයන්ති තෙජනං
දාරුං නමයන්ති තච්ඡකා - අත්තානං දමයන්ති පණ්ඩිතා

(ධම්මපදය)

*(ලකුණු 10 × 2 = 20යි.)*

03. පහත දැක්වෙන වාක්‍ය, රීතිය නොබිඳ පාලියට නගන්න.

I. දෙවිවරු පින් ගෙවීමෙන් ද ආයුෂ ගෙවීමෙන් ද දෙව්ලොවින් චුත වෙති.

II. භික්ෂුව උදෑසන ම නැගිට මළුව අමදියි.

III. සර්වඥ තෙම විහාරයට පැමිණි සියලු දෙනාට ම ධර්මය දේශනා කළේ ය.

IV. සියලු සත්වයෝ ම තමන්ගේ ශරීරයන් හැර දමා පරලොව යති.

V. ඉදින් තොප නිතර බුදුන් සිහි කරයි නම් තොපට භයක් නූපදින්නෝ ය.

*(ලකුණු 4 × 5 = 20යි.)*

04. (I) පහත සඳහන් සන්ධි පද විසන්ධි කරන්න.

I. තීණිමානි
II. සබ්බෙව
III. යස්සදානි
IV. සඤ්ඤාති
V. චක්ඛුන්ද්‍රියං
VI. අකතඤ්ඤො'සි
VII. ඡායාව
VIII. චන්දොදය
IX. ආබාධිතො'හං
X. මධූදකං

*(ලකුණු 1 × 10 = 10යි.)*

(II) පහත සඳහන් සමාස පද කවර සමාසයකට අයත් දැයි නම් කරන්න.

I. සෙතහත්ථී
II. කණ්හසප්පො
III. රත්තුප්පලං
IV. තිදණ්ඩං
V. ආගතසමණො
VI. රුක්ඛපතිතො
VII. ගීතවාදිතං
VIII. දිට්ඨධම්මො
IX. උපනීතභොජනං
X. බහිනගරං

*(ලකුණු 1 × 10 = 10යි.)*

05. පහත සඳහන් බාලාවතාර සූත්‍රයන්ට අර්ථ ලියා උදාහරණ 2 බැගින් සපයන්න.

I. වමොදුදන්තානං
II. අබ්භො අභි

III. ලොපංච තත්‍රාකාරො
IV. වග්ගන්තං වා වග්ගෙ
V. යවමදනතරළාචාගමා

*(ලකුණු 4 x 5 = 20යි.)*

06. I. **"නදී"** ශබ්දය සියලු විභක්තිවල වරනගා වගුගත කරන්න.
II. '√සූ' ධාතුව සත්තමී ආඛ්‍යාත උභය පදයෙහි වරනගා වගුගත කරන්න.

*(ලකුණු 10 x 2 = 20යි.)*

07. I. ඛුද්දක නිකායට අයත් ග්‍රන්ථ ලියා දක්වා අපදානපාළිය පිළිබඳ හැඳින්වීමක් කරන්න.
II. අභිධර්ම පිටකය සංවර්ධනය වී ඇති ආකාරය පිළිබඳ සටහනක් ලියන්න.

*(ලකුණු 10 x 2 = 20යි.)*

08. I. පාලි භාෂාව සංවර්ධනය වූ ආකාරය පෙන්වා දෙන්න.

II. පොල්වත්තේ බුද්ධදත්ත හිමියන් පාලි සාහිත්‍යයට කළ සේවාව පෙන්වා දෙන්න.

*(ලකුණු 10 x 2 = 20යි.)*

*** 